# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1983/31 - 2016 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා - 2016.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම උපලේඛනයේ I සහ II හි I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ දනටමත් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයන් හැර එම ලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනේ සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තාවූ ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශ එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

පාඨලී චම්පික රණවක (පා. ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2016 ජූලි මස 22 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 සහ 18 වන මහල්,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය 1**

***කළුතර දිස්ත්‍රික්කය***

*I වන තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය අනුව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කළ අංක 38/16 හා 1979.06.01 දින දරන කළුතර නගර සභා බල ප්‍රදේශය ද, අංක 62 හා 1979.08.09 දින දරන බේරුවල නගර සභා බල ප්‍රදේශය ද, අංක 72/14 හා 1980.01.25 දිනැති ගැසට් නිවේදනයේ සඳහන් බල ප්‍රදේශය ද, (බුලත්සිංහල නාගරික සංවර්ධන බල ප්‍රදේශය) අංක 100/4 හා 1980.08.04 දින දරන පානදුර නගර සභා බල ප්‍රදේශය ද, අංක 100/4 හා 1980.08.04

*II වන තීරුව*

උතුරට :

මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිමත්, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම හා පරණ ගාලු පාරෙහි ; බොල්ගොඩ ගඟෙහි මධ්‍ය රේඛාව පැරණි පාලම ඡේදනය


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය 1 (*සම්බන්ධිතයි*)

*I වන තීරුව*

දින දරන හොරණ නගර සභා බල ප්‍රදේශය ද, අංක 223/16 හා 1982.12.17 දින දරන ශ්‍රී ලංකා ජනරජයේ වෙරළබඩ කලාපය ද, අංක 419/5 හා 1986.09.15 දින දරන මතුගම සුළු නගර සභා සීමාව ද, අංක 442/17 හා 1987.02.27 දිනැති *ගැසට් නිවේදනයේ* සඳහන් බල ප්‍රදේශ ද, (දෙඩන්ගොඩ නාගරික සංවර්ධන බල ප්‍රදේශය ද) අංක 679/2 හා 1991.09.09 දින දරන *ගැසට් නිවේදනයේ* සඳහන් බල ප්‍රදේශය ද (බණ්ඩාරගම නාගරික සංවර්ධන බල ප්‍රදේශය ද) අංක 821/23 හා 1994.06.02 දින දරන *ගැසට් නිවේදනයේ* සඳහන් බල ප්‍රදේශය ද (අලුත්ගම නාගරික සංවර්ධන බල ප්‍රදේශය ද) අංක 1004/19 හා 1997.12.04 දින දරන ඉංගිරිය නගරය ආශ්‍රිත ප්‍රදේශය ද, අංක 1239/27 හා 2002.06.07 දින දරන *ගැසට් නිවේදනයේ* සඳහන් බල ප්‍රදේශය ද (බොල්ගොඩ ගඟ ආශ්‍රිත කලාපය) අංක 1248/22 හා 2002.08.09 දින දරන අගලවත්ත, පාලින්ද නුවර, පැලවත්ත - මීගහතැන්න නාගරික බල ප්‍රදේශයන් ද, අංක 1270/30 හා 2003.01.09 දින දරන බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, අංක 1420/17 හා 2005.11.23 දරන උපලේඛන අංක 1හි සඳහන් කළුතර දිස්ත්‍රික්කය තුළ දකුණු අධිවේගී මාර්ගය ඇතුළත් කලාපය ද, අංක 1393/6 හා 2005.05.18 දින දරන *අතිවිශෙෂ ගැසට් නිවේදනයේ* සඳහන් කළුතර, පානදුර, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් ද, අංක 1455/14 හා 2006.07.25 දින දරන හොරණ විශේෂ නාගරික සංවර්ධන බල ප්‍රදේශය හා අංක 1270/30 හා 2003.01.09 දිනැති *ගැසට් නිවේදනයේ* සඳහන් බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද හා මෙයට අමතරව බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයට අයත් වන්නා වූ මෙහි II වැනි තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය ද වේ.

*II වන තීරුව*

වන ලක්ෂ්‍යයෙන් පටන් ගෙන මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ ගිණිකොන දෙසට ගමන්කර, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම් හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ඊසාන දෙසටත් දකුණු මායිම් ඔස්සේ නැගෙනහිර දෙසටත් ගමන්කර, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර හා දකුණු මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ ගිණිකොන දෙසට ගමන්කර පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර හා දකුණු මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ ගිණිකොන දෙසට ගමන් කර ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද වේ.

**නැගෙනහිරට :**

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණ දිශාවට ගමන්කර, කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු හා බටහිර මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර, අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණු හා බටහිර දෙසට ගමන් කර කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ බටහිර හා දකුණු දෙසට ගමන්කර, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද වේ.

**දකුණට :**

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ බටහිර දෙසට ගමන්කර තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ දකුණු දෙසට ගමන් කර නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර හා උතුරු මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ බටහිර දෙසට ගමන්කර, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ බටහිර දෙසට ගමන් කර බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ බටහිර දෙසට ගමන්කර ඉන්දියන් සාගරයේ ඉහල වඩදිය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද වේ.

**උපලේඛනය** 1 (සම්බන්ධිතයි)

| *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|
| | බටහිරට : |
| | අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඉන්දියන් සාගරයේ වඩදිය රේඛාව ඔස්සේ උතුරු දෙසට ගමන්කර, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන්සිට මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ උතුරු දෙසට ගමන්කර ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ. |

09-907

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.